# දරුවන් නොමැති කාන්තාවන් සම්බන්ධයෙන් පවතින සාම්ප්‍රදායික ගැමි දෘෂ්ටිකෝණය වෙනස් කිරීමෙහිලා රිද්දියාගයේ උපයෝගීතාව පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. ඒ. චමත් සමීර ආනන්ද , එම්. ආර්. ගුණරත්න
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
chamathsame@gmail.com

අමනුෂයෝපද්‍රව සහ රෝග පීඩාදී මිනිස් ජන ජීවිතයට බාධා පමුණුවන්නා වූ කාරකයන් දුරු කොට සෞභාග්‍යය උදා කර ගැනීම සඳහා සිංහල ශාන්තිකර්ම බිහිවිය. එනමුත් ශාන්තිකර්මයන්ගේ ප්‍රභවය කවර කලක සිදු වූයේ දැයි නිශ්චිත වශයෙන් කිව නො හැකිය. මාතර, බෙන්තර, දෙවිනුවර ආදී ප්‍රදේශවල ව්‍යාප්තව පවතින පහතරට ප්‍රධාන ශාන්තිකර්මයක් ලෙස රිද්දියාගය හෙවත් රටයකුම හැඳින්විය හැකිය. කාන්තාවන් උදෙසා යකුන් විෂයෙහි පවත්වන එකම ශාන්තිකර්මය මෙන්ම සිංහල නර්තන ක්ෂේත්‍රයේ භාව පූර්ණ නෘත්‍ය ගති ලක්ෂණ අන්තර්ගත එකම සිංහල ශාන්තිකර්මය ද මෙය වේ. ගර්භ සංරක්ෂණය මූලික කොට ගනිමින් දරුවන් නොමැති විවාහක කාන්තාවන්ට දරුවන් ලැබීමටත්, ගර්භනී කාන්තාවන්ට ආරක්ෂාව සලසා දීමටත්, අතුරු අන්තරාවකින් තොරව දරුවන් බිහි කිරීමට අවශ්‍ය මානසික පසුබිම සැකසීමෙහිලා, අභිචාර කර්ම අතර රිද්දියාගය ප්‍රධාන ස්ථානයක් ගනී. සිංහල ගැමි සමාජයේ මුල් බැසගත් විවේචනයට ලක් කළ හැකි සාම්ප්‍රදායික අදහස් බැහැර කිරීමෙහි දී රිද්දියාගය උසුලන්නේ අද්විතීය ස්ථානයකි. දරුවන් නොමැති විවාහක කාන්තාවන්ට සමාජයේ එල්ලවන බලපෑම ස්ත්‍රියට පමණක් එල්ල වීමට ඉඩනොදී පුරුෂයාටද එහි වගකීම් අඩු වැඩි වශයෙන් ඇති බව රිද්දියාගය තුළින් සනාථ කරවයි. සංකේතාත්මක භාෂාව, රංග භාණ්ඩ ආදී සියලුම රංගෝපක්‍රම ශාන්තිකර්මකරුවා ඉතා සියුම් ලෙස යොදා ගනිමින් දරුවන් වැදීමට නො හැකි කාන්තාව පිළිබඳව කලු ආකල්ප සමාජ දෘෂ්ටිකෝණයේ සිට සානුකම්පිත දෘෂ්ටියකට හැරවීම සඳහා රිද්දියාගය තුළදී උත්සාහ ගනී. දරුවන් නොමැති කාන්තාව කෙරෙහි බලපාන්නා වූ සමාජ දුර්මතයන් වෙනස් කිරීමෙහිලා රිද්දියාගයේ බලපෑම පිළිබඳව සිදු කරන ලද මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව ලෙස දරුවන් නොමැති කාන්තාව කෙරෙහි සිංහල සමාජ ව්‍යුහයේ පවතින දුර්මත බැහැර කිරීමට රිද්දියාගයේ මැදිහත් වීම කෙතරම් ද යන්න දැක්විය හැකි ය. දරුවන් නොමැති වීම හුදෙක් කාන්තාවටම පැවරිය නො හැකි වගකීමක් බව මෙන් ම එකී වගකීම ම පුර්ෂයාටද පවතී'යි යන උපන්‍යාසයේ සිට මෙම පර්යේෂණය සිදු කරන ලදී. පර්යේෂණයේදී ගුණාත්මක දත්ත විශ්ලේෂණය යටතේ ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත එක්රැස් කිරීම සඳහා භාවිතා කළ පර්යේෂණ ක්‍රමවේද ලෙස පුස්තකාල විමර්ශනය, ඍජු නිරීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා සිදු කෙරිණි. එකී දත්ත විශ්ලේෂණයේදී සමාජය තුළ ගැහැණියට හිමි වන භූමිකාව පිරිමියාට සාපේක්ෂව ඉතා අවම මට්ටමක පවතින බවත් එවැනි අවස්ථාවක දරුවන් නොමැති වීම තුළ ගැහැණිය සමාජ ගර්හාවට ලක් වීමට හේතුවක් වී ඇති බවත් පර්යේෂණය තුළින් ගම්‍ය විය. ගර්භ සංරක්ෂණය වෙනුවෙන් ගැමියා පවත්වන රිද්දියාගය තුළින් එකී සංකල්පය අතික්‍රමණය කර දරුවන් නොමැති කාන්තාව කෙරෙහි ඇති සමාජීය චින්තනය නවමු මඟකට යොමු කිරිමට රිද්දි යාගය සමත්කම් දක්වන බව මෙම පර්යේෂණය මඟින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** රිද්දියාගය; රටයකුම; වඳ ස්ත්‍රිය; පීතෘමූලිකවාදය; කලු ආකල්ප